සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
01 SEP 2023
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
ගැටඹේ - පේරාදෙණිය

01 SEP 2023

# කෘෂිකර්ම අමාත්‍යාංශය
# கமத்தொழில் அமைச்சு
# Ministry of Agriculture

පශු සම්පත් අංශය / கால்நடை பிரிவு / Livestock Division

අංක.80/5, බිම් මහල, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල
இல.80/5, தரைத்தளம், "கொவிஜன மந்திரய", ராஜமல்வத்தை ஒழுங்கை, பத்தரமுல்லை
No.80/5, Ground Floor, "Govijana Mandiraya", Rajamalwatta Lane, Battaramulla

මගේ අංකය / எனது இல. / My No. MREA/04/03/08/07-III

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2023.09.01

1. ලේකම්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
2. ලේකම්, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය
3. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
4. ප්‍රධාන ලේකම්, (බස්නාහිර/සබරගමුව/දකුණ/වයඹ/මධ්‍යම/ඌව/උතුරු මැද/නැගෙනහිර/උතුර) පළාත් සභාව
5. පළාත් අධ්‍යක්ෂ (බස්නාහිර/සබරගමුව/දකුණ/වයඹ/මධ්‍යම/ඌව/උතුරු මැද/නැගෙනහිර/උතුර) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/07/1637/2021 හා 2023.08.25 දිනැති ලිපියේ දැනුම්දීම අනුව ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා එම සේවයේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවන අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 2023.09.15 දින වේ. අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා අයදුම්පත මේ සමඟ ඔබ වෙත යොමු කරමි. මෙම අයදුම්පත කෘෂිකර්ම අමාත්‍යාංශ agrimin.gov.lk හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව www.daph.gov.lk යන වෙබ් අඩවි ඔස්සේ බාගත කර ගත හැකිය. මෙම අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් නොපමාව අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

02. මෙහිදී නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් අදාළ නිර්දේශ සහිතව 2023.09.15 දිනට පෙර ලියාපදිංචි තැපැල මගින් අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

03. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය අගය කරමි.

මෙනකා පී. අබේරත්න
අතිරේක ලේකම් (පාලන) – පශු සම්පත් අංශය

අත්. කලේ/ [illegible]
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය

පිටපත් -
1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.
2. අතිරේක ලේකම්,පශු සම්පත් සංවර්ධන (වැ.බ.) - කරු.දැ.ගැ.ස.

Director General
Dept. of Animal Production & Health
P. O. Box 13, Gatambe
Peradeniya

ලේකම් / செயலாளர் / Secretary | දුරකථන / தொலைபேசி / Telephone - 011 2034340 ; ඊ-මේල් / மின்னஞ்சல் / e-mail ; ෆැක්ස් / தொலைநகல் / Fax - 011 2 863497 | කාර්යාලය / அலுவலகம் / Office | දුරකථන / தொலைபேசி / Telephone 011 2 883 779, 011 2 883 791, 011 2 883 789 | ෆැක්ස් / தொலைநகல் / Fax 011 2 883 983

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු 04ක පවතින පුරප්පාඩු පිරවීමට අදාළව නිලධාරීන් උසස් කිරීම සඳහා අංක 1840/51 හා 2013.12.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නව සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** වැටුප් පරිමාණය

2016.02.25 දින අංක 03/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.88,000-12X2,700-120,400(SL-3-2016) වේ.

**03.** සපුරාලිය යුතු සුදුසුකම්

03.1 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වසර 18ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) උපයාගෙන තිබිය යුතුය.

03.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක මට්ටම හෝ ඊට වඩා ඉහළ මට්ටමක පැවතීම.

03.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

03.5 අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබීම හා I ශ්‍රේණියේ නිලධාරීන්ට අදාළ පුහුණු අවශ්‍යතා සපුරා තිබීම.

04. මෙම තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් උසස් කිරීමට අදාළව මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පතට අනුව අයදුම්පත් කැඳවන අතර, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අදාළ සියළු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. එම අයදුම්පත් හා අදාළ ලිපි ලේඛන ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන **2023.09.15** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " **ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ
පේරාදෙණිය

05. ලැබෙන අයදුම්පත් අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට එහි ප්‍රතිඵල අනුව වැඩිම ලකුණු ලබා ගනු ලබන නිලධාරීන් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. ලකුණු පරිපාටිය පහත පරිදි වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන විෂය ක්ෂේත්‍රයන් හා උපරිම ලකුණු ප්‍රමාණය

| ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| **ජ්‍යෙෂ්ඨතාවය ලකුණු 40** | I වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය සේවා කාලය ඉක්මවා ඇති වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවයට හිමි ඉහළම ලකුණු ප්‍රමාණය ලබා දෙන අතර සෙසු නිලධාරීන්ට පහත ආකාරයට ලකුණු ලබා දෙනු ලැබේ.<br><br><u>ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු</u> X අදාළ නිලධාරියාගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු X 12 + මාස )<br>වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු X 12 + මාස ) |
| **කුසලතාවය ලකුණු 60** | **2.1 ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය සඳහා - උපරිම ලකුණු 10**<br><br><u>I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු</u> X අදාළ නිලධාරියාගේ I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය (අවුරුදු X 12 + මාස)<br>I ශ්‍රේණියේ තනතුරක වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු X 12 + මාස)<br><br>**2.2 වෘත්තීය ක්‍රියාකාරකම් (ඉදිරිපත් කිරීම) - උපරිම ලකුණු 20**<br>• අන්තර්ගතය තුළ ක්ෂේත්‍රයේ උන්නතියට වන දායකත්වය - ලකුණු 08<br>• පරීක්ෂණ මණ්ඩලය යොමු කරන ගැටළු සඳහා දක්වන ප්‍රතිචාර - ලකුණු 05<br>• ඉදිරිපත් කිරීමේ විලාශය හා කාල කළමනාකරණය - ලකුණු 04<br>• සැකසුම, නිර්මාණය - ලකුණු 03<br><br>(නිලධාරියා විසින් පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට ඉටු කරන ලද රාජකාරි කටයුතු සම්බන්ධයෙන් පරිගණක ආශ්‍රයෙන් කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීමක් වේ. එය අදාළ කාලසීමාවට සරිලන ලෙස ස්ව අභිමතය පරිදි තෝරාගත හැකිය. නිලධාරියා විසින් ඉටු කරන ලද රාජකාරි බවට සනාථ කිරීම සඳහා වූ ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.)<br><br>**2.3 වෙනත් සුදුසුකම් - උපරිම ලකුණු 25**<br>පළාත්,ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ලබාගෙන ඇති සුවිශේෂි ජයග්‍රහණ හෝ ප්‍රශංසා ලිපි (පොදු 230බී ආකෘතියෙන්) හෝ<br>අන්තර්ජාතික හෝ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රකාශන හෝ<br>අන්තර්ජාතික හෝ ජාතික විද්‍යාත්මක සඟරාවල පළ කරන ලද පත්‍රිකා<br><br>(මෙහිදී නිලධාරියාගේ සෘජු දායකත්වය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සනාථ කලයුතු අතර, එක් අවස්ථාවකට ලකුණු 05 බැගින් උපරිම අවස්ථා 05ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. ප්‍රසංසා ලිපි අයදුම්පත් කැඳවීමේ දිනට පෙර දිනයක නිකුත් කරන ලද්දක් විය යුතුය.)<br><br>**2.4 සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය - උපරිම ලකුණු 05**<br>සන්නිවේදන කුසලතාවය සඳහා - ලකුණු 02<br>නායකත්වය සඳහා - ලකුණු 02<br>පෞරුෂත්වය සඳහා - ලකුණු 01 |
| **මුළු ලකුණු 100** | |

07. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම් කිරීමට අපේක්ෂිත නිලධාරීන් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කරගන්නා ලද අයදුම් පත්‍රය හා වෙනත් ලේඛනවල ඡායාපිටපත් සහතික කරන ලද පිටපත් ඇතුලත් ගොණුවක්ද සමඟ යොමු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
අයදුම්පත් අංකය - [ ]

1. නිලධාරියාගේ සම්පූර්ණ නම :
.......................................................................................................................................
.......................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :...................................................................
3. උපන් දිනය :...................................................................
4. දැනට දරණ තනතුර :...................................................................

5.වර්තමාන සේවා ස්ථානය:........................................................................................................
   5.1. ලිපිනය :...................................................................................................
   5.2. කාර්යාලීය දුරකථන අංකය:.................................................................................................
   5.3. පෞද්ගලික දුරකථන අංකය:...............................................................................................

6. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පත්වීම් හා උසස් වීම් දින
   6.1. ශ්‍රී ලං. ස. නි. හා සෞ. සේ. III(II/II) ශ්‍රේණියේ පත්වීම් දිනය:.................................................
   6.2. ශ්‍රී ලං. ස. නි. හා සෞ. සේ. II (II/I) ශ්‍රේණියට උසස් වීම් දිනය :.............................................
   6.3. ශ්‍රී ලං. ස. නි. හා සෞ. සේ. I ශ්‍රේණියට උසස් වීම් දිනය :...................................................
   (අදාළ පත්වීම් ලිපියේ හා උසස් වීම් ලිපිවල සහතික කල පිටපත් අයදුම්පත සමඟ ඇමිණිය යුතුය.)

7. සේවා කාලය -
   7.1. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ මුළු සේවා කාලය :
   අවු. :......................... මාස:.......................... දින:....................................
   7.2. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය :
   අවු. :......................... මාස:.......................... දින:....................................

8. I ශ්‍රේණියට උසස් වීමෙන් පසු සේවයේ නොසිටි කාල සීමාවන් හා විනයානුකූල දඬුවම් ලැබීම මත සේවා කාලය අඩු වීම -
   අවු. :......................... මාස:.......................... දින:....................................

8.1. ලබා ගෙන ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර (අදාළවේ නම් පමණක් සම්පූර්ණ කරන්න)

| කාල වකවානුව | | ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| සිට | දක්වා | අවු. | මාස | දින |
| | | | | |
| | | | | |
| | | | | |

8.2. විනය කරුණු මත සේවා කාලය අඩු වීම (අදාළවේ නම් පමණක් සම්පූර්ණ කරන්න)

| විනය තීරණය | චෝදනා පත්‍රය අනුව වරද සිදු වූ කාල සීමාව | සේවා කාලය අඩු වන දින ගණන | | |
|---|---|---|---|---|
| | | අවු. | මාස | දින |
| | | | | |
| | | | | |
| | | | | |
| සේවා කාලය අඩු වන සම්පූර්ණ දින ගණන | | | | |

9. පූර්වාසන්න පස් වසර තුළ වැටුප් වර්ධක ලබා තිබීම

9.1. උසස් වීම් ලැබීමට පූර්වාසන්න පස් වසර තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත. (අදාළ නොවන වචනය කපා හරින්න.)

9.2. උසස් වීම් ලැබීමට පූර්වාසන්න පස් වසර තුළ වැටුප් වර්ධක ලබා නොමැති නම් වැටුප් වර්ධක05 (පහ) ලබන දින තෙක් උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනය නැවත ගණනය කල යුතුය. ඒ අනුව සුදුසුකම් ලබන දිනය - : .....................................................

(වැටුප් වර්ධක පත්‍රිකා 05 (පහ) සහතික කළ පිටපත් 9.1සිට 9.5 දක්වා අංක කර ඇමුණුම වශයෙන් එක් කල යුතුය.)

10. පූර්වාසන්න වසර 05 (පහ) තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබීම.

10.1. ගොනුව අනුව උසස් වීමට සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 (පහ) තුළ කිසිදු විනය දඬුවමකට ලක් වී ඇත / නැත. (අදාල නොවන වචනය කපා හරින්න.)

10.2. 10.1.හි සඳහන් කර ඇති කාල සීමාව තුළ විනය දඬුවමකට ලක් වී ඇති අතර, 8.2 කරුණ යටතේ කරුණු සඳහන් කර ඇත්නම් හා ඒ අනුව උසස්වීම් සංශෝධනය වේ නම් එම දිනය - : .....................................................

11. උසස් වීමට සුදුසුකම් ලබන දිනට පූර්ව වසර 05 තුළ ලබා ගෙන ඇති කාර්ය සාධන මට්ටම

| අනු අංකය | වර්ෂය | අවසාන ඇගයුම (**විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි /සතුටුදායකයි / අසතුටුදායකයි**) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ඉහත එක් එක් වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව සෑම පේළියක් හා තීරුවක්ම සම්පූර්ණ කල යුතුය. අදාළ කාර්යසාධන වාර්තා 05 හි සහතික කල පිටපත් 11.1 සිට 11.5 දක්වා අංක කර ඇමිණිය යුතු අතර, අවසාන ඇගයුමෙහි විකල්ප නිර්දේශ දක්වා ඇති හා අදාළ නිලධාරියාගේ අත්සන, නිල මුද්‍රාව තබා නොමැති වාර්තා පිළිගනු නොලැබේ.)

12. මුල් පත්වීම් දින සිට සේවා වාර්තාව (දැනට දරණ තනතුර හා සේවා ස්ථානය මුලින් සඳහන් කර අනුපිළිවෙළින් විස්තර සටහන් කරන්න.)

| තනතුර | සේවා ස්ථානය | පත්වීම් බලධාරියා කවරෙක්ද? | කාල සීමාව | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

මවිසින් ඉහත අංක 01 සිට 12 දක්වා සඳහන් කර ඇති සියළු කරුණු සත්‍ය බවත්, සම්පූර්ණ තොරතුරු සහිත ඉල්ලුම්පත හා ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කරන ලෙස සඳහන් කර ඇති සියළු ලිපි ලේඛන වල සහතික පිටපත් උපදෙස් දී ඇති පරිදි අංක කර, අංක අනුපිළිවෙලින් අමුණා <u>**ගෝනුවක් වශයෙන් සකස් කර**</u> මෙ සමඟ ඉදිරිපත් කරමි. එමෙන්ම .................................. දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I පන්තියේ වසර .......... මාස .......... දින.......... ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත් ප්‍රකාශ කර සිටිමි.

දිනය :.....................................................

.....................................................

අයදුම්කරුගේ අත්සන

**පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කරනු ලබන ආයතන ප්‍රධානියාගේ සහතිකය**

01. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ........................................................... මහතා/ මහත්මිය/මෙනෙවිය..........................................................(තනතුර) වශයෙන්.................................හි (සේවා ස්ථානය) සේවය කරන නිලධාරියෙකු බවත් ඔහු / ඇය විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි.

02. මෙම නිලධාරියාගේ රාජකාරී / හැසිරීම / කුසලතා හා කාර්ය සාධනය ඇගයීමට ලක් කරන ලද අතර, ........................................................................................ මහතා / මහත්මිය / මෙනවිය ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සළකා බැලීම නිර්දේශ කරමි. / නොකරමි.

03. ඒ අනුව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත හා ඊට අදාළ ලිපි ලේඛන වල සහතික කල පිටපත් ඇතුළත් ඇමුණුම් සියල්ල ඇතුළත් ගොනුව මේ සමඟ ඉදිරිපත් කරමි.

දිනය :.................................................

...................................................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා / පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නිල මුද්‍රාව :

---

**අමාත්‍යාංශ / පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ.................................................................................................... මහතා / මහත්මිය / මෙනවිය ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සළකා බැලීම සම්බන්ධයෙන් ................................................... දෙපාර්තමේන්තු / පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ සමඟ මමද එකඟ වෙමි / එකඟ නොවෙමි.

දිනය :.................................................

...................................................................................
(අමාත්‍යාංශ ලේකම් / පළාත් අමාත්‍යාංශ ලේකම්)
නිල මුද්‍රාව :